**සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම - 2017**

**------------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව නිකුත් කරනු ලැබේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ('මණ්ඩලය') වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය පුකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ කරගන්නා වූ පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

----------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163((2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ලැබී තිබුණු තොරතුරුවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මූලික කාර්යාල 10 ට අදාළව රු. මිලියන 31.35 ක සහ රු.මිලියන 3,879.05 ක ණය ගැතියන් පිළිවෙලින් වසර තුනකට වැඩි සහ වසර එකේ සිට තුන දක්වා කාලයක් අයකිරීමකින් තොරව පැවතුණි.

(ආ) අනුරාධපුර මූලික කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 12 ට අදාළව රු.29,676,316 ක රඳවා ගැනීමේ මුදල් වසර 04කට වඩා වැඩි කාලයක් අයකිරීමකින් තොරව පැවතුණි.

(ඇ) දකුණු මූලික කාර්යාලයට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් වූ ව්‍යාපෘති වලට අදාලව රු. 31,269,667 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වර්ෂ 04 කට වඩා වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල පැවතුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | මෙම චක්‍රලේඛයේ සඳහන් වන පරිදි අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, රු. මිලියන 1,111.07ක ඉල්ලුම් තැන්පතු, කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු වැනි කෙටි කාලීන ආයෝජන මාර්ග වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12/. යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශය | |
| (i) 4.2.5 ඡේදය | ණය ගැතියන්, ණය හිමියන් සහ තොග කාල විශ්ලේෂණ සහ සෙමින් චලනය වන සහ භාවිතයට නුසුදුසු තොග හඳුනාගැනීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කර නොමැත. |
| (ii) 5.1.3 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම වාර්ෂික අයවැය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත අවශ්‍ය පරිදි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 4.2.1 ඡේදය | සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 158,390,770 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. 110,224,038 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලය රු. 48,166,732 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ මූල්‍ය ආදායම රු. 56,801,791 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී සමාගම රු. මිලියන 12,345ක සමස්ත වත්කම් භාවිතා කර රු. මිලියන 158ක බදු පෙර ශුද්ධ ලාභයක් උපයාගෙන තිබුණි. එබැවින්, සමස්ත වත්කම්වල ප්‍රතිලාභ සියයට 1.28 ක් පමණක් වූ අතර එය පෙර වර්ෂයේ දී සියයට 1.11 ක් වී තිබීමෙන් වත්කම්වල ප්‍රතිලාභ සමාන කර්මාන්තයේ පිළිගත් අනුපාතයට සාපේක්ෂව බෙහෙවින් අඩු බව නිරීක්ෂණය විය.

ආ) සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 5.55 සහ සියයට 1.29 ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 1.6 කින් අඩු වී ඇති අතර ශුද්ධ ලාභ අනුපාතය 0.02 කින් ඉහළ ගොස් තිබේ. සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ ලාභ අනුපාතය සියයට 2.9 ක මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කළද එය අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) සමාගමේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රකාශනයට අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 75,959. ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 817 ක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (සීඊසීබී) විසින් සමාගමට පවරා දී ඇත. කෙසේ වෙතත්, ඉදිකිරීම් ව්‍යාපෘති 20 ක් සඳහා අදාල පාර්ශව අතර ගිවිසුම් අත්සන් කර නොමැත. තවද, රු. මිලියන 62.95 ක්වූ ඉදිකිරීම් ව්‍යාපෘති 04 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොතිබූ අතර රු. මිලියන 1,592.36 ක්වූ ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක් සඳහා පිරිනැමුම් ලිපි ලබාගෙන නොතිබුණි.

(ආ) බදුල්ල මූලික කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ ඇස්ෆෝල්ට් නිෂ්පාදනය හා විකිණීම යටතේ රු. 7,954,812 ක අලාභයක් ලබා තිබුණි.

(ඇ) ආයතනික සැලැස්මට අනුකූලව ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් සකස් කර නොතිබූ අතර, එම ඉලක්ක සපුරා ගැනීම සඳහා හැකිවන පරිදි නිලධාරීන්ට වගකීම පවරා නොතිබුණි.

(ඇ) සමාගමේ මූලික කාර්යාල විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමකින් තොරව ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය විවිධ මිල ගණන් යටතේ සැපයුම්කරුවන් කිහිප දෙනෙකුගෙන් මිලදී ගෙන ඇත. ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමෙන් පසු යම් ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය සියලු ද්‍රව්‍ය උචිත සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීමට හැකි වූයේ නම්, සමාගමට සැලකිය යුතු මහජන මුදලක් ඉතිරි කර ගැනීමේ අවස්ථාව උදාකර ගැනීමට හැකිව තිබුණි.

**4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

රත්නපුර මූලික කාර්යාලයේ පළාත් මට්ටමේ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් රු .2,134,400 ක් වටිනා ලැප්ටොප් පරිගණක හයක් සහ ජංගම දුරකථන 10 ක් මිලදී ගෙන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකුට ඔහු විසින් කරන ලද ඉල්ලීම් මත නිකුත් කර තිබුණි. මේ සඳහා නිශ්චිත මූල්‍ය ප්‍රතිපාදනයක් කර නොමැති. අතර, මෙම අයිතමවල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට වාර්තා කර නොතිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

සමාගමේ අනුමත සේවක සංඛ්‍යාවට අනුව, 2017 දෙසැම්බර් 31 වන විට තනතුරු වල 77 ක් අතිරික්තව තිබුණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි..

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය පාලනය**

අයවැය සහ තථ්‍ය සංඛ්‍යා අතර සියයට 25 සිට සියයට 154 දක්වා සැලකිය යුතු විචල්නයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

අ) සමාගමේ මූල්‍ය බලතල පැවරීමේ ලේඛනය සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 33 වන පරිපූරකයට අනුව, ප්‍රසම්පාදන වටිනාකම රු. මිලියන 10 ඉක්මවූ පසු සමාගම ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය කළ යුතුය. කෙසේ වුවද, මෙම විධිවිධානයට පටහැනිව සමාගම විසින් පහත සඳහන් භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදනයේදී තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබීය.

| මූලික කාර්යාලයේ නම | ප්‍රසම්පාදන වටිනාකම පිළිබඳ විස්තරය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| කටුබැද්ද | වෛද්‍ය ගෑස් (Medical Gas) පද්ධතිය සැපයීම සහ සවි කිරීම | 20,869,297 |
| ජාවත්ත | ඇලුමිනියම් දොරවල් සහ ජනෙල් සැපයීම, පිරිසැකසුම් කිරීම සහ සවි කිරීම. | 16,367,059 |
| | සම්බන්ධිත බාර් (Reinforcement Bars) සැපයීම | 86,000,000 |

| | |
|---|---|
| "එච්" යකඩ සැපයුම | 33,708,522 |
| තහඩු (Sheet Pile) සැපයීම | 69,391,300 |
| තහඩු සැපයීම (Sheet Pile), ප්‍රවාහනය සහ නිස්සාරණය | 19,835,000 |
| ජල කාන්දු නොවන කටයුතු (Water Proofing Works) | 17,580,000 |
| ලබා ගත හැකි වානේ තහඩු ප්‍රවාහනය සහ නිස්සාරණය | 15,480,000 |
| සකස්කරන ලද කොන්ක්‍රීට් (Ready Mixed Concrete) සැපයීම | 12,216,250 |

ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව මිල සැසඳුම් ක්‍රමය යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින හතක් ලබා දිය යුතු වුවද, කටුබැද්ද මූලික කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු .1,984,793 ක් වටිනා ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇත්තේ දින එකක් හෝ දෙකක් පමණි.

ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 හි සඳහන් කර ඇති පරිදි කිසිදු විශේෂ අවස්ථාවක් නොමැතිව පහත සඳහන් වැඩ හා භාණ්ඩ මිල දී ගැනීම සඳහා මිල කැඳවීම් සඳහා ජාවත්ත මූලික කාර්යාලය විසින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමවේදය අනුගමනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රසම්පාදන විස්තරය | කොන්ත්‍රාත්කරුගේ නම | කොන්ත්‍රාත්තුවේ වටිනාකම |
|---|---|---|
| | | රු. |
| ඇලුමිනියම් පැතිකඩ සැපයීම | ඇලුමෙක්ස් පීඑල්සී | 6,409,137 |
| සන් ලුවර් සවි කිරීම | එක්සෙල් එන්ටර්ප්‍රයිසස් | 1,890,000 |
| සන් ලුවර් සවි කිරීම | ශාන්ත ඇලුමිනියම් ඩිසයිනර් | 817,760 |

## 6. පද්ධති සහ පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති පාලනයේ දුර්වලතා වරින්වර සමාගමේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන අංශ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

| පද්ධති සහ පාලන අංශ | නිරීක්ෂණ |
|---|---|
| අ) ඉන්වෙන්ට්‍රි පාලනය සහ තොග කළමණාකරණය | සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී වැඩබිම් වල ඇති සියලුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා තොග වටිනාකම් හා මිලදී ගැනීම මූල්‍ය ප්‍රකාශන සඳහා ඇතුලත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| ආ) ස්ථාවර වත්කම් පාලනය කිරීම | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද භාවිතා කළ හැකි වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට සහ භාවිතා කළ නොහැකි වත්කම් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අදාළ චක්‍රලේඛවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම. |